# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 187/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 02/02/2024 පැය 0810

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමක් සම්බන්ධයෙන් ආධාර අනුබල දුන් සැකකාරියක් සහ සැකකරුවන් දෙදෙනෙකු මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2023.06.17 වන දින මීටියාගොඩ පොලිස් වසමේ සීනිගම ප්‍රදේශයේ දී රත්ගම ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙකුට වෙඩි තබා ඝාතනය කිරීමට තැත් කර බරපතල තුවාල සිදු කිරීමේ අපරාධයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු සහ සැකකාරියක් කිරිබත්ගොඩ පොලිස් වසමේ රැඳී සිටින බවට පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත 2024.02.01 වන දින වැටලීමක් සිදුකර **වෙඩි තැබීමට ආධාර අනුබලදීම සම්බන්ධව සැකකාරියක් සහ සැකකරුවෙකු 2024.02.01 වන දින කිරිබත්ගොඩ පොලිස් වසමේ වේවැල්දූව ප්‍රදේශයේදී අත්අඩංගුවට** ගෙන ඇත. සැකකාරිය සන්තකයේ තිබී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 580 ක්** තිබී සොයා ගෙන ඇති අතර, සැකකාරියට ඉහත නඩුව සම්බන්ධයෙන් බලපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණය මගින් විවෘත වරෙන්තුවක්ද නිකුත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 23 ක් වන දොඩන්දූව ප්‍රදේශයේ පදිංචිකාරියක් වන අතර, සැකකරු වයස අවුරුදු 32 ක් වන මුද්දරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

විදේශ රටක සිටින අපරාධකරුවෙකු මෙම වෙඩි තැබීම මෙහෙයවා ඇති බවටත් ඔහුගේ මත්ද්‍රව්‍ය ජාවාරම මෙරට සිදු කිරීමට ඉහත සැකකාරිය සහ සැකකරු ආධාර අනුබල ලබා දෙන බවටත් විමර්ශනයේදී අනාවරණය වී ඇත. තවද මෙම සැකකාරියට සහ සැකකරුට සැඟවීමට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් තවත් සැකකරුවෙකු ද හුණුපිටිය ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත. මෙම සැකකරු විදේශයක සිට මෙම වෙඩි තැබීම සහ මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙයවනු ලබන සංවිධානාත්මක අපරාධකරුගේ සමීපතමයෙකු බවටද අනාවරණය වී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුවන් වැඩිදුර විමර්ශන සඳහා කිරිබත්ගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. කිරිබත්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.